# ව්‍යුහය:



ඒකාබද්ධ සම්බන්ධීකරණ කමිටුව (JCC)

ප්‍රධානී: කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්

**ව්‍යාපෘති කණ්ඩායම**
- කෘ.දෙ. ල කෘෂ අමාත්‍යාංශ
  - ව්‍යාපෘති අධ්‍යක්ෂක
  - ව්‍යාපෘති කළමණාකරු
  - ව්‍යාපෘති සම්බන්ධීකාරක
  - අනෙකුත් සහකරුවන්: පළාත් කෘ.දෙ., උ.බෝ. පර්. සං. ආ., ක්.බො. පර්.සං.ආ.,ව්‍යා.පු.ම, ආදී
- ජයිකා විශේෂඥ කංඩායම (ජපන් විශේෂඥයින්)

**ජයිකා**
- ජයිකා ශ්‍රී ලංකා කාර්යාලය
- ජයිකා දූත මණ්ඩල සාමාජිකයින්


*සහයෝගීතා කටයුතු*

**නිපෝන් කෝයි(NK)**
- ජයිකා පලි. පො. ආ. යෝ. හා. ප්‍ර. ව්‍යාපෘතිය.
- NK කොළඹ කාර්යාලය

**අදාල වෙනත් ආයතන**
- ජපන් තානාපති කාර්යාලය
- අදාල ජපන් ජාතිකයින්
- සහාය හවුල්කරුවන්

- විදේශ සම්. දෙ.(ERD)
- පාර්ශ්වකරුවන් (රාජ්‍ය, පුද්ගලික සහ අධ්‍යයන සාමාජිකයින් )


# කාල සීමාව:






සංවේදීකරණ වැඩමුළුව, නුවරඑළිය දිස්ත්‍රික්කය, මධ්‍යම පළාත

# ව්‍යාපෘති ප්‍රදේශ




# ව්‍යාපෘති කාර්යාලය




SHEP&SSC ව්‍යාපෘති කාර්යාලය
පැළෑටි හා ජාන සම්පත් මධ්‍යස්ථානය, තැ, පෙ, 59,
ගන්නෝරුව, පේරාදෙණිය.
දු, ක, +94 (0) 77-740-3010
ඊ මේල්: Riyas Mohomed <riyas403010@gmail.com>



2023 නොවැම්බර් මස SHEP & SSC විසින් ප්‍රකාශයට පත් කරනු ලදී,


## ජයිකා තාක්ෂණික සහයෝගීතාවය

# SHEP&SSC

**සැපයුම් දාම ව්‍යූහ ශක්තිමත් කිරීම මගින් කුඩා හා මධ්‍යම පරිමාණයේ කෘෂිකර්ම නිෂ්පාදකයන්ගේ ජීවනෝපාය ඉහල නැංවීමේ ව්‍යාපෘතිය**



*සැපයුම් දාම ව්‍යූහය ශක්තිමත් කිරීම තුලින් ඉලක්ක ප්‍රදේශයේ කුඩා හා මධ්‍යම ගොවියන්ගේ ජීවනෝපාය වැඩි දියුණු කරනු ලැබේ*
*( සමස්ථ ව්‍යාපෘති අරමුණින් උපුටා ගන්නා ලදී)*

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**
**-ජපන් අන්තර්ජාතික සහයෝගීතා ආයතනයේ සහයෝගය සහිතව-**

# පසුබිම:

2020 -2030 සඳහා වූ ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය (NAP) විසින් පලදායිතා සංවර්ධනය, කෘෂිකාර්මික අංශයේ අන්තර් ජාතික තරගකාරිත්වය වැඩි කිරීම, සහ දේශගුණික විපර්යාස වලට ඔරොත්තු දීමේ හැකියාව හා ජීවනෝපාය වැඩි දියුණු කිරීම අවධාරණය කරනු ලබයි.





සීමිත බෙදා හැරීමේ ජාල, විවිධ මට්ටමේ අතරමැදියන් හරහා බෙදා හැරීමේ දී වැය වන අධික පිරිවැය, අධික පශ්චාත් අස්වනු හානි, වැනි බොහෝ බාධාවන්ට ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සැපයුම් දාමය මුහුණ දී ඇත. කෙසේ වෙතත්, මේ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා සපලවත් ව්‍යාප්ති ප්‍රවේශයක් රජය සතුව නොමැතිය. ප්‍රයෝජනවත් තාක්ෂණයන් සහ වෙළඳපොළ තොරතුරු ප්‍රචලිත කිරීම සඳහා ව්‍යාප්ති ක්‍රමය ශක්තිමත් කිරීම අභියෝගයක්ව පවතී.

# ව්‍යාපෘතිය:



කුඩා පරිමාණ උද්‍යාණ බෝග වගා සවි බල ගැන්වීමේ හා ප්‍රචලිත කිරීමේ (ෂෙප් -SHEP) ප්‍රවේශය භාවිතයට ගෙන, උද්‍යාන වගා බෝග වල සැපයුම් දාම ශක්තිමත් කිරීම මගින් ඉලක්ක ගත කුඩා හා මධ්‍යම පරිමාණ ගොවීන්ගේ ජීවනෝපාය ඉහල නැංවීම කෙරෙහි මෙම ව්‍යාපෘතිය යොමු වෙයි.

# වෙළඳපොල පාදක කර ගත් කෘෂිකර්ම ව්‍යාප්ති ක්‍රමය-ෂෙප්(SHEP)


. සම්ප්‍රදායික "වැවීමෙන් පසු අලෙවි කිරීම" වෙනුවට "අලෙවි කිරීම පිණිස වැවීම" නම් වෙළඳපොළ සවිඥානික කෘෂිකර්ම කළමණාකරණයක් යෝජනා කිරීම තුලින් ෂෙප් ව්‍යාප්ති ප්‍රවේශය මගින් ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

**SHEP ක්‍රියාත්මක කිරීම සඳහා වන අත්‍යවශ්‍ය පියවර හතර**

| පියවර 4 | කටයුතු |
|---|---|
| **1. ගොවීන් සමඟ ඉලක්කය බෙදා ගැනීම.** | සංවේදීකරණ වැඩමුළුව |
| **2. ගොවීන් දැනුවත් වීම.** | සැලසුම් කිරීමේ අවධිය<br>සහභාගීත්ව මූලික සමීක්ෂණය<br>-පාර්ශවකරුවන්ගේ රැස්වීම (අනිවාර්ය නොවේ)<br>වෙළඳපල සමීක්ෂණය |
| **3. ගොවීන් තීරණ ගැනීම.** | හැරවුම් ලක්ෂය<br>ඉලක්කගත බෝග තේරීම<br>බෝග කැලැන්ඩර සෑදීම<br>ක්‍රියාත්මක කිරීමේ අවධිය |
| **4. ගොවීන් කුසලතා ලබා ගැනීම.** | ක්ෂේත්‍රයේ පුහුණුවීම් |
| පසු විපරම් සහ අධීක්ෂණය (සහභාගි අවසාන සමීක්ෂණය ඇතුළුව) | |

# සැපයුම් දාමය ශක්තිමත් කිරීම

සැලසුම්කරණ අවස්ථාවේ දී පවත්වනු ලැබූ රාජ්‍ය සහ පුද්ගලික අංශ වල විද්වතුන්ගෙන් සැදුම් ලත් සංසදයක් හරහා සැපයුම් දාම ක්‍රියාත්මක සැලසුම් 9 ක් සකස් කර ගන්නා ලද අතර අදාල පාර්ශ්වකරුවන් සමග ඒවා ක්‍රියාත්මක කිරීමට නියමිත ය.




# අරමුණ:

අදාල සැපයුම් දාමය ශක්තිමත් කිරීම මගින් ව්‍යාපෘතියෙන් ඉලක්ක කරනු ලබන කුඩා හා මධ්‍යම පරිමාණ ගොවීන්ගේ ජීවනෝපාය ඉහල නැංවීම ව්‍යාපෘතියේ අරමුණ වෙයි. .

# ප්‍රතිඵල:

1. වෙළඳපොළ පාදක කර ගත් කෘෂිකර්ම ව්‍යාප්තිය භාවිතා කර සැපයුම් දාමය ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාත්මක සැලැස්මක් සම්පාදනය කිරීම සහ ඊට සියලු පාර්ශ්වකරුවන්ගේ එකගතාවය ලබා ගැනීම.
2. වෙළඳපොළ පාදක කෘෂිකර්මය පිළිබඳව ඉලක්ක ගොවීන්ගේ හැකියාව වැඩි දියුණු කිරීම.
3. ඉලක්ක ප්‍රදේශයේ උද්‍යාන වගා බෝග වල සැපයුම් දාමය ශක්තිමත් කිරීම.
4. ව්‍යාපෘතිය තුලින් අත් පත් කර ගනු ලබන දැනුම හා අත්දැකීම් පුළුල් ලෙස රට පුරා බෙදා හැරීම.

# ක්‍රියාකාරකම්:

**ප්‍රතිඵල 1 සඳහා: ක්‍රියාකාරකම් සැලසුම් කිරීම**

- වෙළඳපොළ පාදක කෘෂිකාර්මික ව්‍යාප්තිය සඳහා ක්‍රියත්මක සැලැස්මක් සකස් කිරීම.
- උද්‍යාන වගා බෝග වල සැපයුම් දාම ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම.

**ප්‍රතිඵල 2 සඳහා: ෂෙප් (SHEP)**

- ෂෙප් (SHEP) ක්‍රම පිළිබඳව ව්‍යාප්ති කාර්ය මණ්ඩල වලට දැනුමක් ලබා දීම.
- වෙළඳපොළ පාදක කෘෂිකාර්මික ව්‍යාප්ති කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ව්‍යාප්ති කාර්ය මණ්ඩල වලට සහයෝගය ලබා දීම .
- ශ්‍රී ලංකාවට ගැලපෙන වෙළඳපොළ පාදක කෘෂිකර්ම ව්‍යාප්ති අත්පොතක් පිළියෙල කිරීම.

**ප්‍රතිඵල 3 සඳහා: සැපයුම් දාමය**

- සැපයුම් දාම ශක්තිමත් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම.
- සැපයුම් දාමයට සම්බන්ධ පාර්ශ්ව කරුවන් අතර තොරතුරු හුවමාරු කර ගැනීමේ දී පහසුකම් සැලසීම.
- සැපයුම් දාම සක්තිමත් කිරීමට මාර්ගොපදේශ මාලාවක් සැකසීම.

**ප්‍රතිඵල 4 සඳහා: ව්‍යාපෘති තිරසාර බව**

- ව්‍යාපෘතියේ ප්‍රථිපල රජයට හා අනෙකුත් පාර්ශ්වකරුවන්ට ප්‍රචාරණය කිරීම .
- තිරසාර කටයුතු සඳහා ප්‍රතිපත්ති හා පිරිවැය සම්පාදනයේ දී ප්‍රතිඵල විදහා දැක්වීමට උනන්දු කිරීම.